ජාතික ප්‍රජාතන්ත්‍රවාදී පෙරමුණ
தேசிய ஜனநாயக முன்னணி
**NATIONAL DEMOCRATIC FRONT**

# පක්ෂ ව්‍යවස්ථාව

1995 මාර්තු මස 10 වන දින සම්පාදනය කර
2022 ඔක්තෝබර් මස 30 වැනි දින
පළමුවරට සංශෝධිතයි

ජාතික ප්‍රජාතන්ත්‍රවාදී පෙරමුණ
NATIONAL DEMOCRATIC FRONT

57 a

## පටුන


1 පළමුවන පරිච්ඡේදය ....................2
2 දෙවන පරිච්ඡේදය ....................6
3 තුන්වන පරිච්ඡේදය ....................13
4 හතරවන පරිච්ඡේදය ....................16
5 පස්වන පරිච්ඡේදය ....................21
6 හයවන පරිච්ඡේදය ....................25
7 හත්වන පරිච්ඡේදය ....................27
8 අටවන පරිච්ඡේදය ....................29




* පළමුවන ව්‍යවස්ථා සංශෝධනයේදී සංශෝධනය කරන ලදී.

1995 මාර්තු 10 වන දින සම්පාදනය කර 2022 ඔක්තෝබර් මස 30 වන දින පළමු වරට සංශෝධිතයි.

## පළමුවන පරිච්ඡේදය

### 1 පක්ෂය

(i) පක්ෂයේ නම "ජාතික ප්‍රජාතන්ත්‍රවාදී පෙරමුණ" වන්නේ ය.

(අ) **ජාතික ප්‍රජාතන්ත්‍රවාදී පෙරමුණ**
(ආ) தேசிய ஜனநாயக முன்னணி
(ඇ) **NATIONAL DEMOCRATIC FRONT**

* *(ii) පක්ෂයේ මැතිවරණ සලකුණ "මෝටර් රථය" වන්නේ ය.*



* *(iii) පක්ෂයේ නිල වර්ණය "තැඹිලි" පැහැය වන්නේ ය.*

* *(iv) පක්ෂයේ ප්‍රධාන කාර්යාලයේ ලිපිනය "NDF ගොඩනැගිල්ල, අංක 201/07, පෝරේ, අතුරුගිරිය." වන්නේ ය.*

* *(v) පක්ෂයේ නිල වෙබ් අඩවිය www.ndf.lk වන්නේ ය.*

### 2 පක්ෂයේ සාමාජිකත්වය

* *(i) වයස අවුරුදු 18ක් සම්පූර්ණ වී ඇති ඕනෑම ශ්‍රී ලාංකික පුරවැසියෙකුට පක්ෂයේ සාමාජිකත්වය සඳහා ඉල්ලුම් කළ හැකි වන්නේ ය.*

(ii) වෙනත් කිසිදු දේශපාලන පක්ෂයක සාමාජිකයෙකුට ජාතික ප්‍රජාතන්ත්‍රවාදී පෙරමුණෙහි පක්ෂ සාමාජිකත්වය ලබා ගත නොහැක්කේ ය.

(iii) පක්ෂ සාමාජිකත්වය ඉල්ලුම් කළ දින සිට මාස තුනක කාල සීමාවක් ගත වන තෙක් ඉල්ලුම්කරු අර්ධ සාමාජිකයෙකු ලෙස හැඳින්විය යුත්තේ ය.

(iv) අර්ධ සාමාජිකයෙකු විසින් සිය සාමාජික අයදුම්පත තමා ස්ථිර පදිංචිය දරන ප්‍රදේශයේ පක්ෂ ශාඛා සමිතිය හරහා වාර්ෂික සාමාජික ගාස්තුව ද සමග එම ශාඛා සමිතියේ ලේකම්වරයා වෙත භාරදිය යුත්තේ ය. ශාඛා සමිතියේ ලේකම්වරයා විසින් ආසන බල මණ්ඩලයයේ ලේකම්වරයා වෙත යොමු කළ යුත්තේ ය. ඉන්පසු ආසන බල මණ්ඩලයයේ ලේකම්වරයා විසින්



* පළමුවන ව්‍යවස්ථා සංශෝධනයේදී සංශෝධනය කරන ලදී.

1995 මාර්තු 10 වන දින සම්පාදනය කර 2022 ඔක්තෝබර් මස 30 වන දින පළමු වරට සංශෝධිතයි.

පක්ෂයේ මහලේකම් වෙත එම අයදුම්පත්‍රය යොමු කළ යුත්තේ ය. ඉන්පසු ගතවන මාස තුනක අධීක්ෂණ කාලසීමාව තුලදී මෙම සාමාජිකත්වය ඉල්ලුම්කරුවා සම්බන්ධයෙන් යම් විරෝධතාවයක් පැන නොනැගුණහොත් පමණක් පක්ෂයේ මහලේකම්වරයා විසින් එම ඉල්ලුම්කරු වෙත පක්ෂ සාමාජිකත්වය පිරිනැමිය යුත්තේ ය. එතැන් සිට ඔහු පක්ෂයේ පූර්ණ සාමාජිකයෙකු ලෙස පිළිගැනුම් ලබන්නේ ය.

(v) පක්ෂ සාමාජිකත්ව ඉල්ලුම්කරු ස්ථිර පදිංචිය දරන ප්‍රදේශයේ පක්ෂයේ ආසන බල මණ්ඩලය නොමැති විටකදී පක්ෂයේ ස්ථිර සාමාජිකයින් දෙදෙනෙකුගේ අනුමැතිය සහිතව සාමාජික අයදුම්පත්‍රය ඉල්ලුම්කරු ස්ථිර පදිංචිය දරන ප්‍රදේශයේ දිස්ත්‍රික් බල මණ්ඩලයේ ලේකම්වරයා මඟින් පක්ෂයේ මහලේකම්වරයා වෙත යොමු කළ යුත්තේ ය.

* *(vi) පක්ෂ සාමාජිකත්වය ඉල්ලුම්කරනු ලබන විශේෂ අයදුම්කරුවන් හට පූර්ණ පක්ෂ සාමාජිකත්වය ලබා දීමට පක්ෂයේ සභාපතිත්වයට/නායකත්වයට සහ පක්ෂයේ දේශපාලන මණ්ඩලය වෙත පූර්ණ බලය ඇත්තේ ය.*

* *(vii) මීට අමතරව **www.ndf.lk** පක්ෂයේ නිල වෙබ් අඩවියට පිවිසීමෙන්ද පක්ෂ සාමාජිකත්වය ඉල්ලුම් කිරීමට හැක්කේ ය.*

* *(viii) යම් සාමාජික අපේක්ෂකයෙකු හට සිය සාමාජිකත්වය ලබාගැනීමට නොහැකි වුවහොත් ඒ සඳහා පක්ෂයේ මහලේකම්වරයා වෙත නැවත ඉල්ලුම් කිරීමට හැක්කේ ය.*

## 3 සාමාජික මුදල්

* *(i) සෑම පක්ෂ සාමාජිකයෙකු විසින් වාර්ෂික සාමාජික ගාස්තු ලෙස රුපියල් සියයක (රු.100.00) මුදලක් පක්ෂයේ භාණ්ඩාගාරික වෙත ගෙවිය යුත්තේ ය.*

* *(ii) පක්ෂයේ මධ්‍යම කාරක සභාවේ සාමාජිකයින් විසින් පක්ෂ සාමාජික ගාස්තුවට අමතරව රුපියල් දහසක (රු.1000.00) මුදලක් පක්ෂයේ භාණ්ඩාගාරික වෙත ගෙවිය යුත්තේ ය.*

* *(iii) පක්ෂයේ දේශපාලන මණ්ඩලයේ සියලුම සාමාජිකයින් පක්ෂ සාමාජික ගාස්තුවට අමතරව රුපියල් එක්දහස් පන්සියයක (රු.1500.00) මුදලක් පක්ෂයේ භාණ්ඩාගාරික වෙත ගෙවිය යුත්තේ ය.*

* (iv) මීට අමතරව පක්ෂයේ සාමාජිකයින් පක්ෂයේ නිලධාරීන් හා පක්ෂයේ මහජන නියෝජිතයින් පක්ෂයේ මධ්‍යම කාරක සභාව විසින් නියම කරනු ලබන අනුග්‍රහයන් පක්ෂය වෙත ලබා දීමට බැඳී සිටිය යුත්තේ ය.



* පළමුවන ව්‍යවස්ථා සංශෝධනයේදී සංශෝධනය කරන ලදී.

## 4 සාමාජිකත්වය අලුත් කිරීම

(i) සෑම වර්ෂයකම මුල් මාස තුන තුළ දී එම වර්ෂය සඳහා සාමාජික මුදල් ගෙවීමෙන් පක්ෂ සාමාජිකත්වය තවදුරටත් පවත්වාගත හැක්කේ ය.

## 5 පක්ෂයේ සාමාජිකයින්ට අදාළ කොන්දේසි

(i) පක්ෂයේ ප්‍රතිපත්ති, දේශපාලන වැඩ පිළිවෙල සහ පක්ෂයේ විනයට මුළුමනින්ම එකඟව ක්‍රියා කළ යුත්තේ ය.

(ii) පක්ෂයේ ව්‍යවස්ථාවට අනුකූලව ක්‍රියා කළ යුත්තේ ය.

(iii) සියලුම මැතිවරණ වලදී පක්ෂය විසින් නියම කරනු ලබන නියෝජිතයින්ට හෝ නියෝජිතයෙකුට උපරිම සහයෝගයෙන් ක්‍රියා කළ යුත්තේ ය.

(iv) පක්ෂයේ කීර්තියට හානිකර නොවන අයුරින් සිය පෞද්ගලික ජීවන පැවැත්ම ගෙනයාම සහ ආදර්ශමත්, ගෞරවනීය ශ්‍රී ලාංකික පුරවැසියෙකු ලෙස සමාජය තුළ ක්‍රියාත්මක විය යුත්තේ ය.

## 6 පක්ෂ සාමාජිකයෙකු සතු අයිතිවාසිකම්

(i) පක්ෂයේ පූර්ණ සාමාජිකත්වය ලැබූ ඕනෑම පක්ෂ සාමාජිකයෙකු හට පක්ෂ නායකත්වය දක්වා වූ පක්ෂය තුළ ඕනෑම නිලයකට පත්වීමට පූර්ණ අයිතිය ඇත්තේ ය.

(ii) පක්ෂය තරඟ කරන ඕනෑම මැතිවරණයකදී පක්ෂයේ අපේක්ෂකයෙකු වශයෙන් තරඟ කිරීම සඳහා ඉල්ලුම් කිරීමට සෑම පක්ෂ සාමාජිකයෙකුටම අයිතිය ඇත්තේ ය.

(iii) සමාජයේ ඕනෑම ස්ථානයකදී, ඕනෑම ක්‍රියාකාරීත්වයකදී පක්ෂය විසින් නම් කරන ලද විටෙක පක්ෂයේ නියෝජිතයා වශයෙන් ක්‍රියා කිරීමට අයිතිය ඇත්තේ ය.

(iv) පක්ෂයේ දේශපාලන මණ්ඩලය, මධ්‍යම කාරක සභාව හෝ දිස්ත්‍රික් බල මණ්ඩලයන් විසින් ගනු ලබන තීරණ හෝ යම් ක්‍රියාමාර්ගයන් සම්බන්ධයෙන් සිය මතය පක්ෂයේ සභාපති/පක්ෂ නායකත්වය වෙත ලිඛිතව දැනුම් දීමට සෑම පක්ෂ සාමාජිකයෙකුටම අයිතිය ඇත්තේ ය.

(v) පක්ෂයේ ඕනෑම තරාතිරමක නිලධාරියෙකු හෝ නායකයෙකුගේ ක්‍රියා කලාපය පක්ෂයේ කීර්තිනාමයට, සංවර්ධනයට සහ පොදු සමගියට බාධාවක්



* පළමුවන ව්‍යවස්ථා සංශෝධනයේදී සංශෝධනය කරන ලදී.

යැයි හැඟේ නම්, ඒ සම්බන්ධයෙන් පක්ෂ නායකත්වයට සහ දේශපාලන මණ්ඩලයට ලිඛිතව කරුණු දැක්වීමට සෑම සාමාජිකයෙකුටම අයිතිය ඇත්තේ ය.

(vi) පක්ෂයේ උන්නතිය උදෙසා යෝග්‍ය යැයි තමා සිතන යෝජනාවක් ඇත්නම් එය තමා නියෝජනය කරනු ලබන මැතිවරණ කොට්ඨාස බල මණ්ඩලය වෙත ඉදිරිපත් කර සම්මත කර ගැනීමෙන් පසුව පක්ෂයේ දේශපාලන මණ්ඩලය වෙත යොමු කිරීමට සෑම සාමාජිකයෙකුටම අයිතිය ඇත්තේ ය.

(vii) සෑමවිටම පක්ෂයේ බහුතරයකගේ මතය පිළිගැනීමට සෑම පක්ෂ සාමාජිකයෙකුම බැඳී සිටින්නේ ය.



* පළමුවන ව්‍යවස්ථා සංශෝධනයේදී සංශෝධනය කරන ලදී.

## දෙවන පරිච්ඡේදය

### 1 පක්ෂ සංවිධාන ව්‍යුහය

* 1. පක්ෂයේ සංවිධාන ව්‍යුහය පහත පරිදි සංවිධානය විය යුත්තේ ය.

(i) *ශාඛා සමිති / තරුණ සමිති / කාන්තා සමිති*

(ii) *ප්‍රාදේශීය බල මණ්ඩල / ප්‍රාදේශීය තරුණ බල මණ්ඩල / ප්‍රාදේශීය කාන්තා බල මණ්ඩල*

(iii) *ආසන බල මණ්ඩල /මැතිවරණ කොට්ඨාස බල මණ්ඩල / කොට්ඨාස තරුණ බල මණ්ඩල / කොට්ඨාස කාන්තා බල මණ්ඩල*

(iv) *දිස්ත්‍රික් බල මණ්ඩල / දිස්ත්‍රික් තරුණ බල මණ්ඩල / දිස්ත්‍රික් කාන්තා බල මණ්ඩල*

(v) *ජාතික ප්‍රජාතන්ත්‍රවාදී තරුණ පෙරමුණ*

(vi) *ජාතික ප්‍රජාතන්ත්‍රවාදී කාන්තා පෙරමුණ*

(vii) *මධ්‍යම කාරක සභාව*

(viii) *දේශපාලන මණ්ඩලය*

(ix) *ජාතික ප්‍රජාතන්ත්‍රවාදී පෙරමුණු මහා සම්මේලනය*

### 2

#### I ශාඛා සමිති

* (i) *සෑම ග්‍රාම සේවා වසමක් තුළ ම අවම වශයෙන් පක්ෂයේ එක් ශාඛා සමිතියක් බැගින් පිහිටුවිය යුත්තේ ය.*

* (ii) *ශාඛා සමිතියක් පිහිටුවීමට අවම වශයෙන් පුද්ගලයින් 15 දෙනෙකු සිටිය යුතුය.*

(iii) සෑම ශාඛා සමිතියක් ම සභාපති, උප සභාපති, ලේකම්, උප ලේකම්, භාණ්ඩාගාරික සහ කාරක සභිකයින් පස්දෙනකු ඇතුළත් නිලධාරී මණ්ඩලයක් තෝරා පත්කර ගත යුත්තේ ය.



* පළමුවන ව්‍යවස්ථා සංශෝධනයේදී සංශෝධනය කරන ලදී.

(iv) එම සෑම ශාඛා සමිතියක්ම පිහිටුවීමේදී අවම වශයෙන් පක්ෂයේ දේශපාලන මණ්ඩලයේ හෝ මධ්‍යම කාරක සභාවේ සභිකයෙකු එම රැස්වීමට සහභාගී විය යුත්තේ ය.

(v) එසේ පිහිටුවා ගන්නා සෑම ශාඛා සමිතියක් ම සමිතියේ පූර්ණ වාර්තාවක්, නිළධාරී මණ්ඩලයේ ලේඛනයක්, සහ සාමාජික නම් සහ අත්සන් ලේඛන දෙකක් සමඟින් ආසන බලමණ්ඩලයේ ලේකම්වරයා හරහා පක්ෂයේ මහලේකම්වරයාට යොමු කළ යුත්තේ ය.

(vi) ඉන්පසු පක්ෂයේ මහලේකම්වරයා විසින් එම ශාඛා සමිතිය පක්ෂයේ පිළිගත් ශාඛා සමිතියක් වශයෙන් දේශපාලන මණ්ඩලයේ අනුමැතිය සහිතව පක්ෂ මූලස්ථානයේ දී ලියාපදිංචි කිරීමට ක්‍රියා කළ යුත්තේය.

## II තරුණ සමිතිය

(i) සෑම ග්‍රාම සේවා කොට්ඨාශයකම අවම වශයෙන් එක් තරුණ සමිතියක් වත් පිහිටුවිය යුතු අතර ඒ සඳහා අවම වශයෙන් සාමාජිකයින් පහළොස් දෙනෙකු වත් සහභාගි විය යුත්තේ ය.

* *(ii) මෙම තරුණ සමිතියක සාමාජික සාමාජිකාවන්ගේ වයස අවුරුදු 18 ත් 35 ත් අතර විය යුත්තේ ය.*

(iii) සෑම තරුණ සමිතියකම සභාපති, ලේකම්, උප සභාපති, උප ලේකම්, භාණ්ඩාගාරික සහ කාරක සභිකයින් පස් දෙනෙකුගෙන් සමන්විත නිලධාරී මණ්ඩලයක් තෝරා පත්කර ගත යුත්තේ ය.

(iv) මෙලෙස පිහිටුවා ගන්නා සෑම තරුණ සමිතියක්ම සමිතියේ පූර්ණ වාර්තාවක්, නිලධාරී මණ්ඩලයේ විස්තර සහ සාමාජික නම් සඳහන් අත්සන් ලේඛන දෙකක් පක්ෂයේ තරුණ සංවිධානයේ ලේකම්වරයා මගින් පක්ෂයේ මහලේකම් වරයාට යොමු කළ යුත්තේ ය.

(v) ඉන්පසු පක්ෂය ප්‍රධාන ලේකම්වරයා විසින් එම තරුණ සමිතිය පක්ෂයේ පිළිගත් තරුණ සමිතියක් වශයෙන් පක්ෂ මූලස්ථානයේ ලියාපදිංචි කළ යුතු ය. ඒ සඳහා දේශපාලන මණ්ඩලය අනුමැතිය ලබාගැනීමට පක්ෂයේ මහලේකම්වරයා ක්‍රියා කළ යුත්තේ ය.



* පළමුවන ව්‍යවස්ථා සංශෝධනයේදී සංශෝධනය කරන ලදී.

## * III කාන්තා සමිති

(i) සෑම ග්‍රාම සේවා කොට්ඨාශයකම අවම වශයෙන් එක් කාන්තා සමිතියක් වත් පිහිටුවිය යුතු අතර ඒ සඳහා අවම වශයෙන් සාමාජිකාවන් පහළොස් දෙනෙකු වත් සහභාගි විය යුත්තේ ය.

(ii) සෑම කාන්තා සමිතියකම සභාපති, ලේකම්, උප සභාපති, උප ලේකම්, භාණ්ඩාගාරික සහ කාරක සභිකයින් පස් දෙනෙකුගෙන් සමන්විත නිලධාරී මණ්ඩලයක් තෝරා පත්කර ගත යුත්තේ ය.

(iii) මෙලෙස පිහිටුවා ගන්නා සෑම කාන්තා සමිතියක්ම සමිතියේ පූර්ණ වාර්තාවක්, නිලධාරී මණ්ඩලයේ විස්තර සහ සාමාජික නම් සඳහන් අත්සන් ලේඛන දෙකක් පක්ෂයේ කාන්තා සංවිධානයේ ලේකම්වරයා මගින් පක්ෂයේ මහලේකම් වරයාට යොමු කළ යුත්තේ ය.

(iv) ඉන්පසු පක්ෂයේ මහලේකම්වරයා විසින් එම කාන්තා සමිතිය පක්ෂයේ පිළිගත් කාන්තා සමිතියක් වශයෙන් දේශපාලන මණ්ඩලයේ අනුමැතිය සහිතව පක්ෂ මූලස්ථානයේ දී ලියාපදිංචි කිරීමට ක්‍රියා කළ යුත්තේය.

## * IV වෙනත් ආයතන වල ශාඛා සමිති පිහිටුවීම.

(i) පක්ෂයේ දේශපාලන මණ්ඩලයේ අනුමැතිය ඇතිව රජයේ හෝ පෞද්ගලික ආයතන තුළ ද පක්ෂයේ ශාඛා සමිති, තරුණ සමිති, කාන්තා සමිති හෝ වෘත්තීය සමිති පිහිටුවිය හැක්කේ ය. එලෙස සමිතියක් පිහිටුවීම සහ ලියාපදිංචි කිරීම සඳහා ඉහත සඳහන් ක්‍රියා පටිපාටිය අනුගමනය කිරීමෙන් එම සමිතිය පක්ෂයේ ලියාපදිංචි සමිතියක් බවට පත් කළ හැක්කේ ය.

## V ශාඛා සමිති කිහිපයක සාමාජිකත්වය දැරීම

(i) කිසිදු පක්ෂයක සාමාජිකයෙකුට එකවර එකම වර්ගයේ ශාඛා සමිති දෙකක සාමාජිකත්වය දැරිය නොහැක්කේ ය.

* (ii) නමුත්, යම් පක්ෂ සාමාජිකයෙකුට එකිනෙකට වෙනස් සමිති දෙකක හෝ කිහිපයක සාමාජිකත්වය දැරිය හැක්කේ ය.

(iii) නමුත්, කිසිදු සාමාජිකයෙකු හෝ සාමාජිකාවක එක් සමිතියක නිලයක් දරයි නම් වෙනත් සමිතියක නිලයකට පත් නොවිය යුත්තේ ය.



* පළමුවන ව්‍යවස්ථා සංශෝධනයේදී සංශෝධනය කරන ලදී.

ජාතික ප්‍රජාතන්ත්‍රවාදී පෙරමුණ
NATIONAL DEMOCRATIC FRONT

## * 3 ප්‍රාදේශීය බල මණ්ඩල

(i) මෙහි ප්‍රාදේශීය බල මණ්ඩලයක් යනුවෙන් හඳුන්වා ඇත්තේ යම් පළාත් පාලන ආයතනයකට අදාළ බල ප්‍රදේශයක පිහිටුවන බල මණ්ඩලයක් වේ.

(ii) ප්‍රාදේශීය බල මණ්ඩලය තුළ පිහිටුවා ඇති සෑම ශාඛා සමිති, තරුණ සමිති හා කාන්තා සමිතිවල සභාපති, ලේකම් යන තනතුරු දරන්නන් සිය නිල බලයෙන් මෙම සංවිධානයේ සාමාජිකත්වය දරනු ඇත.

(iii) අදාළ ප්‍රාදේශීය බල මණ්ඩලය තුළ ඇති පළාත් පාලන ආයතනයන්හි මහජන නියෝජිතයන් වශයෙන් තේරී පත්ව සිටින පක්ෂයේ සාමාජිකයින් සහ ප්‍රාදේශීය බල මණ්ඩලය තුළ ස්ථිර පදිංචිය දරන පළාත් සභා සඳහා තේරී පත්ව සිටින පක්ෂයේ සාමාජිකයින් සිය නිල බලයෙන් ප්‍රාදේශීය බල මණ්ඩලයේ සාමාජිකත්වය දරනු ඇත.

(iv) පක්ෂයේ දේශපාලන මණ්ඩලය තීරණය කරනු ලබන අවස්ථාවකදී දස දෙනෙකුට නොවැඩි සාමාජිකයින් ප්‍රමාණයක් ප්‍රාදේශීය බල මණ්ඩලයේ නියෝජිතයන් වශයෙන් පත් කරනු ලැබිය හැකිය. එසේ පත් කරනු ලබන්නන්ට ප්‍රාදේශීය බල මණ්ඩලය තුළ ස්ථිර පදිංචිකරුවන් විය යුතු අතර, නිලධාරී මණ්ඩලයට පත් වීමට අවස්ථාවක් ඔවුන් හට නොමැත.

(v) ප්‍රාදේශීය බල මණ්ඩලය පහත දැක්වෙන පරිදි නිලධාරීන් මණ්ඩලයකින් සමන්විත විය යුත්තේ ය. සභාපති, ලේකම්, භාණ්ඩාගාරික, උපසභාපතිවරු දෙදෙනෙක්, උප ලේකම්වරු දෙදෙනෙක් සහ කාරක සභිකයින් අටදෙනෙකු නිලධාරී මණ්ඩලයට ඇතුළත් විය යුත්තේ ය.

(vi) මෙම නිලධාරී මණ්ඩලය එම ප්‍රාදේශීය බල මණ්ඩලය තුළ පක්ෂයේ ක්‍රියාකාරී මණ්ඩලය වන්නේය.

## * 4 ආසන / මැතිවරණ කොට්ඨාස බලමණ්ඩල / කොට්ඨාස තරුණ බලමණ්ඩල / කොට්ඨාස කාන්තා බලමණ්ඩල

(i) ආසන/ මැතිවරණ කොට්ඨාස බලමණ්ඩල සඳහා ආසනය තුළ පිහිටි සියලු පළාත් පාලන ආයතන වලට අදාල ප්‍රාදේශීය බල මණ්ඩලයන්හි පිහිටුවා තිබෙන සියලුම බලමණ්ඩලවල තනතුරු දරන නිලධාරීන් නිල බලයෙන් ආසන බල මණ්ඩල සඳහා සාමාජිකත්වය හිමිවන්නේ ය.

(ii) සියලුම ආසන බල මණ්ඩල සඳහා සංවිධායකවරුන් පත් කිරීමේ පූර්ණ බලය පක්ෂ සභාපති/පක්ෂ නායක සතු වන්නේ ය.



* පළමුවන ව්‍යවස්ථා සංශෝධනයේදී සංශෝධනය කරන ලදී.

(iii) ආසන/ මැතිවරණ කොට්ඨාස සංවිධායකවරයා නිල බලයෙන් ආසන/ මැතිවරණ කොට්ඨාස බල මණ්ඩලයේ සභාපතිවරයා ලෙස තේරී පත් වන්නේ ය.

(iv) සෑම වර්ෂයකම ආසන/ මැතිවරණ කොට්ඨාස බලමණ්ඩලය ආසන/කොට්ඨාස සංවිධායකවරයා විසින් කැඳවිය යුතු අතර එහිදී යෝජනා ස්ථිරත්වයෙන් ලේකම්, භාණ්ඩාගාරික, උප සභාපතිවරු දෙදෙනෙක්, උප ලේකම්වරුන් දෙදෙනෙක්, කාරක සභිකයින් 8 දෙනෙක් තෝරා පත්කර ගත යුත්තේ ය.

(v) පක්ෂයේ දේශපාලන මණ්ඩලය තීරණය කරනු ලබන අවස්ථාවකදී දස දෙනෙකුට නොවැඩි සාමාජිකයින් ප්‍රමාණයක් අදාළ ආසන බල මණ්ඩලයේ නියෝජිතයන් වශයෙන් පත් කරනු ලැබිය හැකිය. එසේ පත් කරනු ලබන්නන්ට ආසන බල මණ්ඩලය තුළ ස්ථිර පදිංචිකරුවන් විය යුතු අතර, නිලධාරී මණ්ඩලයට පත් වීමට අවස්ථාවක් ඔවුන් හට නොමැත.

(vi) අදාළ ආසන මණ්ඩලයේ වාර්තාව ආසන බල මණ්ඩලයේ ලේකම්වරයා විසින් පක්ෂයේ මහලේකම් වෙත යොමු කළ යුත්තේ ය.

(vii) ආසන බලමණ්ඩලයේ ක්‍රියාකාරික නිලධාරී මණ්ඩලය මාස තුනකට වරක්වත් රැස් විය යුතු අතර එහිදී සාකච්ඡා කරන විශේෂ කරුණු ඇතුළත් රැස්වීම් වාර්තාව පක්ෂයේ මහලේකම්වරයා වෙත එවිය යුත්තේ ය.

(viii) පක්ෂයේ දේශපාලන මණ්ඩලයේ අනුමැතියට යටත්ව ආසන බල මණ්ඩල සඳහා අරමුදලක් පිහිටුවිය හැකි අතර, දේශපාලන මණ්ඩලයේ අනුමැතිය ඇතිව පක්ෂයේ සභාපතිවරයාට ඕනෑම ආසන බලමණ්ඩලයක බැංකු ගිණුමේ ඇති මුදල පක්ෂ මූලස්ථානය වෙත ලබා ගැනීමට බලය ඇත.

(ix) විනය විරෝධී ක්‍රියා පටිපාටියක් සම්බන්ධයෙන් හෝ පක්ෂයේ උන්නතියට බාධාවන ක්‍රියාකාරීත්වයක් සම්බන්ධයෙන් හෝ යම් ආසන බලමණ්ඩලයක ඕනෑම නිලධාරියෙකු ඉවත් කිරීමේ පූර්ණ බලය පක්ෂ සභාපති/පක්ෂ නායක සතු වන්නේ ය.

## * 5 දිස්ත්‍රික් බල මණ්ඩලය

(i) දිස්ත්‍රික් බල මණ්ඩල සඳහා සියලුම ආසන/කොට්ඨාස බල මණ්ඩලවල නිලධාරීන් නිල බලයෙන් සාමාජිකයින් ලෙස තේරී පත්වන්නේ ය.

(ii) පක්ෂයේ දිස්ත්‍රික් නායකයින් පත් කිරීමේ බලය නායක/ සභාපතිවරයා සතුව වන අතර එසේ පත්වන දිස්ත්‍රික් නායකයා නිල බලයෙන් දිස්ත්‍රික් බල මණ්ඩලයේ සභාපති වන්නේ ය.



* පළමුවන ව්‍යවස්ථා සංශෝධනයේදී සංශෝධනය කරන ලදී.

ජාතික ප්‍රජාතන්ත්‍රවාදී පෙරමුණ
தேசிய ஜனநாயக முன்னணி
NATIONAL DEMOCRATIC FRONT

(iii) වසරක් පාසා දිස්ත්‍රික් බල මණ්ඩලය රැස්විය යුතු අතර එහිදී සිදු කරන යෝජනා ස්ථිරත්වයෙන් ලේකම්, භාණ්ඩාගාරික, උප සභාපතිවරුන් සිව්දෙනෙක්, උප ලේකම්වරුන් සිව්දෙනෙක් සහ කාරක සභිකයින් දස දෙනෙක් තෝරා පත්කර ගනු ලැබිය යුත්තේ ය.

(iv) අදාළ දිස්ත්‍රික් මණ්ඩලයේ වාර්තාව දිස්ත්‍රික් බල මණ්ඩලයේ ලේකම්වරයා විසින් පක්ෂයේ මහලේකම් වෙත යොමු කළ යුත්තේ ය.

(v) පක්ෂයේ දේශපාලන මණ්ඩලය තීරණය කරනු ලබන අවස්ථාවකදී දස දෙනෙකුට නොවැඩි සාමාජිකයින් ප්‍රමාණයක් අදාළ දිස්ත්‍රික් බල මණ්ඩලයේ නියෝජිතයන් වශයෙන් පත් කරනු ලැබිය හැකිය. එසේ පත් කරනු ලබන්නන්ට අදාළ දිස්ත්‍රික්කය තුළ ස්ථිර පදිංචිකරුවන් විය යුතු අතර, නිලධාරි මණ්ඩලයට පත් වීමට අවස්ථාවක් ඔවුන් හට නොමැත.

(vi) විනය විරෝධී ක්‍රියා පටිපාටියක් සම්බන්ධයෙන් හෝ පක්ෂයේ උන්නතියට බාධාවන ක්‍රියාකාරීත්වයක් සම්බන්ධයෙන් හෝ යම් දිස්ත්‍රික් බලමණ්ඩලයක ඕනෑම නිලධාරියෙකු ඉවත් කිරීමේ පූර්ණ බලය පක්ෂ සභාපති/පක්ෂ නායක සතු වන්නේ ය.

(vii) දිස්ත්‍රික් බලමණ්ඩලයට අමතරව දිස්ත්‍රික් තරුණ සංවිධානය හා කාන්තා සංවිධානය පිහිටුවිය හැකි අතර එම තරුණ සංවිධානය සහ කාන්තා සංවිධානයේ සභාපති සහ ලේකම් තනතුරු පිරිනමන්නේ පක්ෂයේ සභාපති/ නායක විසිනි. අනෙකුත් කොන්දේසි දිස්ත්‍රික් බල මණ්ඩලය හා සමාන වන්නේ ය.

(viii) සෑම දිස්ත්‍රික්කයක් සඳහාම දිස්ත්‍රික් සංවිධායකවරුන්, දිස්ත්‍රික් කළමනාකරුවන් හා දිස්ත්‍රික් සම්බන්ධීකාරකවරුන් පත් කිරීමේ බලය පක්ෂ සභාපති/ නායකට හිමිවන්නේ ය.

## * 6 ජාතික ප්‍රජාතන්ත්‍රවාදී තරුණ පෙරමුණ

(i) ජාතික ප්‍රජාතන්ත්‍රවාදී තරුණ පෙරමුණ සඳහා දිස්ත්‍රික් තරුණ බලමණ්ඩලවල සියලු නියෝජිතයින් නිල බලයෙන් සාමාජිකයන් ලෙස තේරී පත්වනු ලබයි.

(ii) ජාතික ප්‍රජාතන්ත්‍රවාදය තරුණ පෙරමුණේ සභාපති සහ ලේකම් තනතුරු පිරිනමන්නේ පක්ෂයේ සභාපති/ නායක විසිනි.



* පළමුවන ව්‍යවස්ථා සංශෝධනයේදී සංශෝධනය කරන ලදී.

1995 මාර්තු 10 වන දින සම්පාදනය කර 2022 ඔක්තෝබර් මස 30 වන දින පළමු වරට සංශෝධිතයි.

(iii) වසරක් ජාතික ප්‍රජාතන්ත්‍රවාදී තරුණ පෙරමුණ රැස්විය යුතු අතර එහිදී සිදු කරන යෝජනා ස්ථිරත්වයෙන් භාණ්ඩාගාරික, උප සභාපතිවරුන් සිව්දෙනෙක්, උප ලේකම්වරුන් සිව්දෙනෙක් සහ කාරක සභිකයින් දස දෙනෙක් තෝරා පත්කර ගනු ලැබිය යුත්තේ ය.

(iv) පක්ෂයේ දේශපාලන මණ්ඩලය තීරණය කරනු ලබන අවස්ථාවකදී දස දෙනෙකුට නොවැඩි සාමාජිකයින් ප්‍රමාණයක් ජාතික ප්‍රජාතන්ත්‍රවාදී තරුණ පෙරමුණේ නියෝජිතයන් වශයෙන් පත් කරනු ලැබිය හැකිය.

(v) විනය විරෝධී ක්‍රියා පටිපාටියක් සම්බන්ධයෙන් හෝ පක්ෂයේ උන්නතියට බාධාවන ක්‍රියාකාරිත්වයක් සම්බන්ධයෙන් හෝ ජාතික ප්‍රජාතන්ත්‍රවාදී තරුණ පෙරමුණේ ඕනෑම නිලධාරියෙකු ඉවත් කිරීමේ පූර්ණ බලය පක්ෂ සභාපති/පක්ෂ නායක සතු වන්නේ ය.

## * 7 ජාතික ප්‍රජාතන්ත්‍රවාදී කාන්තා පෙරමුණ

(i) ජාතික ප්‍රජාතන්ත්‍රවාදී කාන්තා පෙරමුණ සඳහා දිස්ත්‍රික් කාන්තා බලමණ්ඩලවල සියලු නියෝජිතයින් නිල බලයෙන් සාමාජිකාවන් ලෙස තේරී පත්වනු ලබයි.

(ii) ජාතික ප්‍රජාතන්ත්‍රවාදය කාන්තා පෙරමුණේ සභාපති සහ ලේකම් තනතුරු පිරිනමන්නේ පක්ෂයේ සභාපති/ නායක විසිනි.

(iii) වසරක් ජාතික ප්‍රජාතන්ත්‍රවාදී කාන්තා පෙරමුණ රැස්විය යුතු අතර එහිදී සිදු කරන යෝජනා ස්ථිරත්වයෙන් භාණ්ඩාගාරික, උප සභාපතිවරුන් සිව්දෙනෙක්, උප ලේකම්වරුන් සිව්දෙනෙක් සහ කාරක සභිකයින් දස දෙනෙක් තෝරා පත්කර ගනු ලැබිය යුත්තේ ය.

(iv) පක්ෂයේ දේශපාලන මණ්ඩලය තීරණය කරනු ලබන අවස්ථාවකදී දස දෙනෙකුට නොවැඩි සාමාජිකයින් ප්‍රමාණයක් ජාතික ප්‍රජාතන්ත්‍රවාදී කාන්තා පෙරමුණේ නියෝජිතයන් වශයෙන් පත් කරනු ලැබිය හැකිය.

(v) විනය විරෝධී ක්‍රියා පටිපාටියක් සම්බන්ධයෙන් හෝ පක්ෂයේ උන්නතියට බාධාවන ක්‍රියාකාරිත්වයක් සම්බන්ධයෙන් හෝ ජාතික ප්‍රජාතන්ත්‍රවාදී කාන්තා පෙරමුණේ ඕනෑම නිලධාරියෙකු ඉවත් කිරීමේ පූර්ණ බලය පක්ෂ සභාපති/පක්ෂ නායක සතු වන්නේ ය.



* පළමුවන ව්‍යවස්ථා සංශෝධනයේදී සංශෝධනය කරන ලදී.

57
m

## තුන්වන පරිච්ඡේදය

### * 1 මධ්‍යම කාරක සභාව

*(i)* *පක්ෂයේ මධ්‍යම කාරක සභාව සාමාජිකයින් 27 දෙනෙකුගෙන් සමන්විත විය යුත්තේ ය. එම 27 දෙනා අතුරින් 9 දෙනෙකු පක්ෂයේ දේශපාලන මණ්ඩලයේ නියොජිතයින් වන්නේ ය.*

*(ii)* *වයස අවුරුදු 25ට වැඩි වූ ඕනෑම පක්ෂ සාමාජිකයෙකු පක්ෂ මධ්‍යම කාරක සභාවේ සාමාජිකයෙකු වීමට සුදුසුකම් ලබන්නේ ය.*

*(iii)* *දිස්ත්‍රික් බල මණ්ඩලයන්හි සභාපති/ලේකම් තනතුරු දරන අය දේශපාලන මණ්ඩලයේ බහුතර කැමැත්ත අනුව පක්ෂයේ සභාපති/පක්ෂ නායක විසින් පක්ෂයේ මධ්‍යම කාරක සභාවට සාමාජිකයින් අටදෙනෙකු තෝරා පත්කර ගනු ලබන්නේ ය.*

*(iv)* *පක්ෂයේ තරුණ පෙරමුණේ හා කාන්තා පෙරමුණේ සභාපති සහ ලේකම් තනතුරු දරන්නන් මධ්‍යම කාරක සභාවේ සාමාජිකයින් වශයෙන් නිල බලයෙන් පත් වන්නේය.*

(v) පක්ෂයේ සභාපති/නායක විසින් පක්ෂ මධ්‍යම කාරක සභාව සඳහා හය දෙනෙකු නම් කළ හැක්කේ ය.

### 2 මධ්‍යම කාරක සභාව රැස් කිරීම සහ මූලාසනය

(i) මධ්‍යම කාරක සභාව අවම වශයෙන් මාස තුනකට වරක් හෝ රැස්විය යුත්තේ ය.

(ii) මධ්‍යම කාරක සභාව පක්ෂයේ මහලේකම් විසින් රැස්කරනු ලැබිය යුත්තේ ය.

* *(iii)* *මධ්‍යම කාරක සභා රැස්වීමේ මුලසුන පක්ෂ සභාපති/පක්ෂ නායක විසින් දැරිය යුත්තේ ය.*

(iv) පක්ෂයේ සභාපතිවරයාට/නායකයාට අවශ්‍ය ඕනෑම අවස්ථාවක මධ්‍යම කාරක සභාක කැඳවන ලෙස මහලේකම්වරයාට නියෝග කිරීමට බලය ඇත්තේ ය.



* පළමුවන ව්‍යවස්ථා සංශෝධනයේදී සංශෝධනය කරන ලදී.

## * 3 මධ්‍යම කාරක සභාවේ සාමාජිකයෙකුගේ සාමාජිකත්වය අහෝසි වන ආකාරය

(i) පක්ෂයේ ප්‍රතිපත්ති, විනය උල්ලංඝනය කරනු ලැබ ඇති විටෙක හෝ පක්ෂයේ උන්නතියට, පක්ෂයේ පොදු සමගියට, කීර්ති නාමයට බාධා වන අයුරින් ක්‍රියාත්මක වන අවස්ථාවකදී ඒ සඳහා පක්ෂයේ විනය මණ්ඩලයට යොමු කරනු ලබන ලිඛිත පැමිණිල්ලක් පිළිබඳව එම සභාව විසින් පවත්වනු ලැබූ විධිමත් පරීක්ෂණයක නිර්දේශ මත පක්ෂයේ සභාපතිවරයාට දේශපාලන මණ්ඩලයේ නොවන මධ්‍යම කාරක සභිකයෙකු එම ධූරයෙන් නෙරපීමට බලය ඇත්තේ ය.

(ii) අපරාධමය වරදක් සම්බන්ධයෙන් අධිකරණයක් හමුවේ වරදකරුවෙකු බවට පත්වන ඕනෑම මධ්‍යම කාරක සභිකයෙකු දැරූ සියලු තනතුරු වලින් නෙරපීමට දේශපාලන මණ්ඩලයට බලය ඇත්තේ ය.

(iii) දේශපාලන මණ්ඩලයේ සභිකයෙකු නොවන ඕනෑම මධ්‍යම කාරක සභිකයෙකු ඉවත් කිරීමේ බලය පක්ෂ සභාපති වෙත පැවරී ඇති අතර, එය දේශපාලන මණ්ඩල සභිකයින් අතුරින් සරල බහුතරයකගේ ආවරණ අනුමැතියට යටත් විය යුත්තේ ය.

(iv) පක්ෂ මධ්‍යම කාරක සභාවේ සාමාජිකයින් වෙත කාර්ය පැවරුම් නියම කිරීමේ පූර්ණ බලය පක්ෂ සභාපති/පක්ෂ නායක වෙත පැවරෙන අතර, ඒ සඳහා පත්වීම් ලිපි නිකුත් කිරීම හා ඔවුන් වෙත කාර්ය පැවරුම් ලබාදීම පක්ෂ සභාපතිවරයාගේ නියමය පරිදි පක්ෂ මහලේකම්වරයා විසින් සිදු කළ යුත්තේ ය.

(v) මධ්‍යම කාරක සභාවේ තුළ කාන්තා නියෝජනය අවම වශයෙන් 25%ක ප්‍රතිශතයක් තුළ පවත්වා ගත යුතු වන්නේ ය.

## * 4 මධ්‍යම කාරක සභාව සතු බලතල සහ වගකීම්

(i) පක්ෂයේ ව්‍යවස්ථාව, ස්ථාවර නියෝග, නීතිරීති සහ සාමාජිකයින්ගේ විනය පද්ධති ආදිය ක්‍රියාකාරීව රැක ගැනීම, ඒ අනුව අවශ්‍ය අවස්ථාවලදී නිලධාරීන් නිලතලවලින් නෙරපීම, තහනම් කිරීම, සංවිධාන පක්ෂයෙන් නෙරපීම, අනුබද්ධිත තත්ත්වයන් අහෝසි කිරීම ආදී ක්‍රියාමාර්ග ගැනීම සම්බන්ධයෙන් අවසාන තීරණය ගැනීමට දේශපාලන මණ්ඩලයට නිර්දේශ ඉදිරිපත් කළ යුතු අතර, ඒ සෑම අවස්ථාවකදීම එම තීරණ මධ්‍යම කාරක සභාවේ සරල බහුතර අනුමැතියට යටත් විය යුත්තේ ය.

(ii) අවශ්‍යතා අනුව විනය මණ්ඩලය, නාමයෝජනා මණ්ඩලය ඇතුලු විවිධ මණ්ඩල සහ කමිටු පත් කිරීමට දේශපාලන මණ්ඩලය වෙත නිර්දේශ



* පළමුවන ව්‍යවස්ථා සංශෝධනයේදී සංශෝධනය කරන ලදී.

කිරීමේ බලය පක්ෂ මධ්‍යම කාරක සභාව සතු වන්නේ ය. ඒ සෑම අවස්ථාවකදීම එම තීරණ මධ්‍යම කාරක සභාවේ සරල බහුතර අනුමැතියට යටත් විය යුත්තේ ය.

(iii) පක්ෂයේ දිස්ත්‍රික් බල මණ්ඩලවලට පහළ කවර සංවිධානයක හෝ ඒවායේ සාමාජිකයෙකුගේ හෝ නිලධාරියෙකුගේ හෝ නියෝජිතයෙකුගේ හෝ ක්‍රියාකලාපය පක්ෂයේ ප්‍රතිපත්ති, ක්‍රියාමාර්ග, තීරණවලට පටහැනි යයිද නැතහොත් පක්ෂයට හානිකර යැයිද ඒත්තු ගියවිට එම සංවිධානයේ හෝ ඒවායේ සාමාජිකයා/සාමාජිකයිනගේ හෝ නිලධාරියා/නිලධාරීන්ගේ හෝ නියෝජිතයා/නියෝජිතයින්ගේ තනතුරු අත්හිටුවීමට නිර්දේශ කිරීමේ බලය මධ්‍යම කාරක සභාව සතු වන්නේ ය.



* පළමුවන ව්‍යවස්ථා සංශෝධනයේදී සංශෝධනය කරන ලදී.

57

## හතරවන පරිච්ඡේදය

### 1 දේශපාලන මණ්ඩලයේ සංයුතිය

(i) දේශපාලන මණ්ඩලය සාමාජිකයින් 09 දෙනෙකුගෙන් සමන්විත විය යුත්තේ ය.

(ii) පක්ෂයේ මහා සම්මේලනයකදී එහි නියෝජිතයන් විසින් තෝරා ගනු ලබන පක්ෂයේ සභාපතිවරයා නිල බලයෙන් දේශපාලන මණ්ඩලයේ සභාපතිවරයාද වන අතර, එම පුද්ගලයා පක්ෂයේ නායකයා ද වන්නේ ය.

* *(iii) පක්ෂයේ උපසභාපතිවරුන් සිව් දෙනෙකු, උපලේකම්වරුන් දෙදෙනෙකු සහ භාණ්ඩාගාරික යන තනතුරු සඳහා නිලධාරීන් පත් කිරීමේ පූර්ණ බලය පක්ෂ සභාපති/පක්ෂ නායක වෙත පැවරෙන අතර, පක්ෂයේ මහලේකම් තනතුර වෙනස් කිරීම සඳහා පක්ෂයේ දේශපාලන මණ්ඩලයේ බහුතරයකගේ අනුමැතියට යටත්ව පක්ෂ සභාපති/පක්ෂ නායක ක්‍රියා කළ හැක.*

### 2 දේශපාලන මණ්ඩලයේ බලතල සහ කාර්යභාරය

(i) මෙය ජාතික ප්‍රජාතන්ත්‍රවාදී පෙරමුණෙහි තීරණාත්මක වූත්, බලවත්වූත් සංවිධානය වන්නේ ය. පක්ෂයේ අනෙකුත් සංවිධාන සියල්ලම දේශපාලන මණ්ඩලයේ බලතල වලට යටත් වන්නේ ය.

(ii) පක්ෂයේ ඕනෑම අංශයක් පිළිබඳව, පක්ෂයේ ඕනෑම තීරණයක් සම්බන්ධයෙන්, පක්ෂයේ ව්‍යවස්ථාවේ ඕනෑම කරුණක් සම්බන්ධයෙන් දේශපාලන මණ්ඩලයේ තීරණය අවසානාත්මක තීරණය වන්නේ ය.

(iii) පක්ෂයේ වෙනත් ඕනෑම මණ්ඩලයක, පක්ෂයට අනුබද්ධ ඕනෑම සංවිධානයක, පක්ෂයේ ඕනෑම ශාඛා සමිතියක නිලධාරියෙකුගේ හෝ ක්‍රියාකලාපය පක්ෂයේ කීර්තියට, පක්ෂයේ ප්‍රතිපත්තීන්ට, පක්ෂ විනයට, පක්ෂයේ පොදු සමගියට සහ පක්ෂයේ දියුණුවට බාධාවක් වේ යැයි දේශපාලන මණ්ඩලයට හැඟෙන ඕනෑම මොහොතක එම ඕනෑම සංවිධානයක හෝ ඕනෑම නිලධාරියෙකුගේ හෝ ක්‍රියාකාරීත්වය තහනම් කරනු ලැබීමටත් ඒ පිළිබඳ පරීක්ෂණයක් පැවැත්වීමටත් පක්ෂයේ විනය මණ්ඩලයටත් පැවරීමටත් දේශපාලන මණ්ඩලයට බලය ඇත්තේ ය. විනය මණ්ඩලය තම පරීක්ෂණයේ නිර්දේශය දේශපාලන මණ්ඩලය වෙත ලබා දුන් පසු උක්ත කරුණ සම්බන්ධයෙන් අවසාන තීරණයක් ගැනීමේ බලය දේශපාලන මණ්ඩලය සතු වන්නේ ය.



* පළමුවන ව්‍යවස්ථා සංශෝධනයේදී සංශෝධනය කරන ලදී.

1995 මාර්තු 10 වන දින සම්පාදනය කර 2022 ඔක්තෝබර් මස 30 වන දින පළමු වරට සංශෝධිතයි.

ජාතික ප්‍රජාතන්ත්‍රවාදී පෙරමුණ
NATIONAL DEMOCRATIC FRONT

(iv) එම අන්දමින් යම් සාමාජිකයෙකුගේ, නිලධාරියෙකුගේ හෝ සංවිධානයක වැඩ තහනම් කරනු ලැබූ අවස්ථාවකදී පක්ෂයේ යාන්ත්‍රණයේ අඛණ්ඩ ක්‍රියාකාරිත්වය පවත්වා ගැනීම සඳහා අවශ්‍ය තීරණ ගැනීමේ බලය පක්ෂයේ දේශපාලය මණ්ඩලය සතු වන්නේ ය.

(v) පක්ෂයේ ඉහළ සංවිධාන විසින් පවත්වාගෙන යනු ලබන අරමුදල්, පක්ෂයේ කාර්යයන් සඳහා අවශ්‍ය වේ යැයි හැඟෙන විටෙකදී ලබාගැනීමට පකෂයේ දේශපාලන මණ්ඩලයට බලය ඇත්තේ ය. නමුත්, එවන් අවස්ථාවකදී දේශපාලව මණ්ඩලය විසින් එම තීරණය ගැනීමට හේතු වූ කරුණු පහළ සංවිධානයන් වෙත පැහැදිලි කිරීමට දේශපාලන මණ්ඩලය වගකීමෙන් බැඳී සිටින්නේ ය.

(vi) පක්ෂය ඕනෑම මැතිවරණයක් වෙනුවෙන් ඉදිරිපත් වන අපේක්ෂකයන් තේරීම සඳහා දේශපාලන මණ්ඩලය සාමාජිකයින් තිදෙනෙකුගෙන් සමන්විත මධ්‍යම නාමයෝජනා මණ්ඩලයක් පිහිටු වීමට පක්ෂ සභාපති/පක්ෂ නායක වෙත බලය ඇත්තේ ය. එම මණ්ඩලය මගින් අපේක්ෂකයන් සම්බන්ධ අවසන් තීරණය ගනු ලබන අතර, පක්ෂයේ සභාපතිවරයාගේ අනුමැතිය ඊට ලැබිය යුත්තේ ය.

* *(vii) පක්ෂයේ අර්ධ සාමාජිකයෙකු හට පූර්ණ සාමාජිකත්වය පිරිනැමීමේ බලය හා විශේෂිත සාමාජිකත්වය පිරිනැනීමේ බලය දේශපාලන මණ්ඩලය සතු වන්නේ ය.*

(viii) පක්ෂයේ සාමාජිකයින් යම් පළාත් පාලන ආයතනයක මහජන නියෝජිතයා වශයෙන් ක්‍රියා කරන අවස්ථාවකදී අවශ්‍ය වූ විටෙකදී එම පළාත් පාලන ආයතනය තුළ ඔවුන්ගේ දේශපාලන ක්‍රියාකාරිත්වය සහ තීරණයන් පාලනය කිරීමේ සහ හැසිරවීමේ අයිතිය පක්ෂයේ දේශපාලන මණ්ඩලය සතු වන්නේ ය.

(ix) පක්ෂයේ සාමාජිකයින් යම් පළාත් සභාවක මහජන නියෝජිතයින් වශයෙන් ක්‍රියා කරන අවස්ථාවකදී අවශ්‍ය වූ විටෙකදී එම පළාත් පාලන ආයතනය තුළ ඔවුන්ගේ දේශපාලන ක්‍රියාකාරිත්වය සහ තීරණයන් පාලනය කිරීමේ සහ හැසිරවීමේ අයිතිය පක්ෂයේ දේශපාලන මණ්ඩලය සතු වන්නේ ය.

(x) පක්ෂයේ සාමාජිකයින් ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරුන් වශයෙන් ක්‍රියා කරන අවස්ථාවකදී අවශ්‍ය වූ විටෙකදී එම පළාත් පාලන ආයතනය තුළ ඔවුන්ගේ දේශපාලන ක්‍රියාකාරිත්වය සහ තීරණයන් පාලනය කිරීමේ සහ හැසිරවීමේ අයිතිය පක්ෂයේ දේශපාලන මණ්ඩලය සතු වන්නේ ය.

(xi) පක්ෂයේ දේශපාලන ගමන් මාර්ගය සහ පක්ෂයේ දේශපාලන දර්ශනය සහ පක්ෂයේ දේශපාලන තීරණයන් ගැනීමේ අවසන් පූර්ණ අයිතිය



* පළමුවන ව්‍යවස්ථා සංශෝධනයේදී සංශෝධනය කරන ලදී.

පක්ෂයේ දේශපාලන මණ්ඩලය සතු වන බැවින්, පළාත් පාලන ආයතන, පළාත් සභා සහ පාර්ලිමේන්තුව වැනි මහජන ආයතන තුළ පක්ෂ සාමාජිකයින් නියෝජනය වන බැවින් පක්ෂයේ එක්සත් භාවය, ඒකමතික භාවය, පක්ෂයේ දේශපාලන ගමන් මාර්ගය පලුදු නොවී රැක ගැනීම උදෙසා එම සෑම මහජන නියෝජිතයෙකුම ඉහත 3(viii), 3(ix) සහ 3(x) වගන්ති අනුව ක්‍රියාකිරීමට බැඳී සිටින්නේ ය. එම වගන්ති අනුව ක්‍රියා නොකරන දේශපාලන මණ්ඩලයේ තීරණයන්ට අවනත නොවන ඕනෑම පක්ෂයේ සාමාජික මහජන නියෝජිතයින්ට එරෙහිව ක්‍රියා කිරීමට දේශපාලන මණ්ඩලයට බලය ඇත්තේ ය.

(xii) පක්ෂය වෙනුවෙන් අරමුදල් ගොඩනැගීම තීරණය කිරීමේ බලය දේශපාලන මණ්ඩලය සතු වන්නේ ය.

(xiii) මධ්‍යම කාරක සභාව විසින් ඉදිරිපත් කරනු ලබන ඕනෑම යෝජනාවක් සම්බන්ධයෙන් අවසන් තීරණ ගැනීමේ බලය පක්ෂයේ දේශපාලය මණ්ඩලය සතු වන්නේ ය.

(xiv) යම් මැතිවරණයකදී පක්ෂය තරඟ කිරීම හෝ නොකිරීම සම්බන්ධයෙන් අවසන් තීරණය ගැනීමේ බලය දේශපාලන මණ්ඩලය සතු වන්නේය. (මීට 8වන පරිච්ඡේදයෙහි විශේෂ විධිවිධාන යටතේ සඳහන් උපවගන්ති ද අදාළ වේ.)

(xv) අනෙකුත් දේශපාලන පක්ෂ සමග සාකච්ඡා කිරීම, මැතිවරණ වලදී වෙනත් දේශපාලන පක්ෂ පක්ෂ සමග පෙරමුණු ගොඩනැගීම, මහජන නියෝජන ආයතන තුළදී අනෙකුත් දේශපාලන පක්ෂ සමග ක්‍රියා කළයුතු ආකාරය පිළිබඳ තීරණ ගැනීමේ බලය පක්ෂයේ දේශපාලන මණ්ඩලය සතු වන්නේ ය.

(xvi) පක්ෂය වෙනුවෙන් නිකුත් කරනු ලබන සියලුම ප්‍රකාශන, පුවත්පත්, පුවත්පත් නිවේදන, ගුවන් විදුලි හෝ රූපවාහිනී වැඩසටහන් සඳහා ඉදිරිපත් කිරීම් ආදියේදී තීරණ ගැනීමේ බලය දේශපාලන මණ්ඩලය සතු වන්නේ ය.

* *3 දේශපාලන මණ්ඩලය රැස්වීම/ මූලාසනය / තීරණ වලංගුභාවයට පත්වන ආකාරය*

*(i) පක්ෂයේ දේශපාලන මණ්ඩලය අවම වශයෙන් මාස තුනකට වරක් හෝ රැස්විය යුත්තේ ය.*



* පළමුවන ව්‍යවස්ථා සංශෝධනයේදී සංශෝධනය කරන ලදී.

(ii) දේශපාලන මණ්ඩලය රැස්වීමේ මුලසුන පක්ෂ සභාපති/ පක්ෂ නායක විසින් දැරිය යුත්තේ ය.

(iii) දේශපාලන මණ්ඩලයේ සාමාජිකයින් හට කාර්ය පැවරුම් ප්‍රදානය කිරීමේ පූර්ණ බලතල පක්ෂ සභාපති/ නායක වෙත ඇත්තේ ය.

(iv) අවශ්‍ය යැයි හැඟෙන ඕනෑම අවස්ථාවක පක්ෂයේ දේශපාලන මණ්ඩලය කැඳවීමට පක්ෂ සභාපති/පක්ෂ නායක වෙත බලය ඇත්තේ ය.

(v) පක්ෂයේ දේශපාලන මණ්ඩලය තුළ යම් කරුණක් සම්බන්ධයෙන් තීරණයක් ගැනීමේ ගැටලු සහගත භාවයක් මතුවුවහොත් ඒ සඳහා ඡන්ද විමසීමක් පැවැත්විය යුත්තේ ය. එම ඡන්ද විමසීම පැවැත්වෙන විටෙකදී දේශපාලන මණ්ඩලයේ සියලුම සාමාජිකයින් ඊට සහභාගී විය යුත්තේය.

(vi) දේශපාලන මණ්ඩලයේ සාමාජිකයින් වෙත පක්ෂ සභාපති/ නායක නොමැතිව කිසිදු තීරණයක් ගැනීමට බලය නැත්තේ ය.

(vii) දේශපාලන මණ්ඩලය විසින් ගනු ලබන සෑම තීරණයක්ම ලිඛිතව සකස් කිරීමට පක්ෂයේ මහලේකම් ක්‍රියාකළ යුත අතර, එම ලේඛනයන්ට පක්ෂ සභාපති/නායකගේ අත්සන යෙදූ පසු එම තීරණය වලංගු තීරණයක් බවට පත්වේ.

(viii) නමුත් යම් හදිසි තත්ත්වයකදී පක්ෂ සභාපති/නායක ට තවත් දේශපාලන මණ්ඩල සාමාජිකයින් සිව්දෙනෙකු සමග එක්ව පක්ෂයට අදාළ ඕනෑම තීරණයක් ගැනීමේ බලය ඇත්තේ ය.

## * 4 දේශපාලන මණ්ඩලයේ සාමාජිකයෙකුගේ ධූරය කාලය අහෝසි වීම

(i) පක්ෂයේ සභාපති/ නායක හැර දේශපාලන මණ්ඩල සාමාජිකයෙකුගේ ධූර කාලය වසර 05 කි.

(ii) එම ධූර කාලයෙන් පසුවද, පක්ෂ සභාපති/ නායක විසින් කරනු ලබන පත්කිරීමකින් පසුව නැවත එම ධූරයේ කටයුතු කළ හැක.

(iii) යම් පක්ෂ සාමාජිකයෙකු දේශපාලන මණ්ඩලයේ සාමාජිකයෙකු වශයෙන් ධූරයක් දරමින් සිටියදී, එම පුද්ගලයා විසින් පෞද්ගලික හෝ නිල තත්ත්වයෙහිලා සිදුකරන ලද්දා වූ ඕනෑම අපරාධමය වරදක් සම්බන්ධයෙන් දිවයිනේ ඕනෑම අධිකරණයක් ඉදිරියෙහිදී වරදකරුවෙකු වුවහොත්, එම අධිකරණ නියෝගය නිකුත් කළ දිනයෙහිදීම එම පුද්ගලයා විසින් පක්ෂය තුළ දරන ලද සියලු තනතුරු ඉවත් කිරීමට විනය මණ්ඩලයේ නිර්දේශ මත පක්ෂ සභාපති/ නායක වෙත බලය ඇත්තේය.



* පළමුවන ව්‍යවස්ථා සංශෝධනයේදී සංශෝධනය කරන ලදී.

*(iv)* *පක්ෂයේ මහලේකම් නොවන ඕනෑම දේශපාලන මණ්ඩල සාමාජිකයෙකු දේශපාලන මණ්ඩලයෙන් ඉවත් කිරීමේ පූර්ණ බලය පක්ෂ සභාපති/පක්ෂ නායක සතු වන්නේ ය.*

*(v)* *පක්ෂයේ දේශපාලන මණ්ඩලයේ සාමාජිකයෙන් ඉල්ලා අස්වූ විටෙක, අස් කරනු ලැබූ විටෙක, මිය ගිය විටෙක හෝ පිළිගත හැකි සාධාරණ හේතුවක් මත ධූරයේ කටයුතු කළ නොහැකි බව පක්ෂ සභාපති/ නායක වෙත ලිඛිතව දැනුම් දුන් අවස්ථාවකදී, පක්ෂ සභාපති/ නායක විසින් පක්ෂයේ මධ්‍යම කාරක සභාවේ සාමාජිකයින් අතුරින් අයෙකු නව තනතුර සඳහා දින දෙකක් ඇතුළත පත් කළ යුතුය.*



* පළමුවන ව්‍යවස්ථා සංශෝධනයේදී සංශෝධනය කරන ලදී.

57

ජාතික ප්‍රජාතන්ත්‍රවාදී පෙරමුණ
NATIONAL DEMOCRATIC FRONT

## පස්වන පරිච්ඡේදය

### * 1 පක්ෂ සභාපති/ නායක

(i) ජාතික ප්‍රජාතන්ත්‍රවාදී පෙරමුණු පක්ෂ ව්‍යවස්ථාවේ සෑම ස්ථානයකම පක්ෂ සභාපති/ නායක සතු බලතල සඳහන්ව ඇත්තේ ය.

(ii) මෙම ව්‍යවස්ථාවෙහි සඳහන් නොවන සියලුම කරුණු සම්බන්ධයෙන් අවසන් තීරණ ගැනීමේ බලය ද පක්ෂ සභාපති/ නායක සතු වන්නේ ය.

(iii) පක්ෂ සභාපති/ නායක විසින් තම අභිමතය පරිදි ගනු ලබන සියලුම තීරණයන් පක්ෂයේ දේශපාලන මණ්ඩලය වෙත ඉදිරිපත් කර එහි අනුමැතිය ලබා ගත යුත්තේ ය.

(iv) පක්ෂයේ උන්නතියට බාධා පමුණුවන ඕනෑම පුද්ගලයෙක්, ඕනෑම තනතුරකින් ඉවත් කිරීමට පක්ෂයේ නායක/සභාපතිවරයාට බලය ඇත්තේය.

(v) ඕනෑම මැතිවරණයේදී පක්ෂය විසින් නම් කරන ජාතික ලැයිස්තු මන්ත්‍රීධූර සඳහා සුදුසු අපේක්ෂකයන්ගේ නම් පක්ෂ සභාපති/ නායක වෙත නිර්දේශ කිරීමේ බලය දේශපාලන මණ්ඩලය සතුවන අතර, යම් මැතිවරණයකින් පසු පක්ෂය වෙත හිමිවන ජාතික ලැයිස්තු මන්ත්‍රීධූර සඳහා සුදුසු පුද්ගලයින්ගේ නම් නිර්දේශ කිරීමේ බලය පක්ෂ සභාපති/නායක සතුවන්නේය.

(vi) පක්ෂ සභාපති/ නායක ධූරය පුරප්පාඩු වන්නේ,

(අ) පක්ෂයේ සභාපති/ නායක ධූරය දරනු ලබන තැනැත්තා යම් අපරාධමය වරදක් සඳහා දිවයිනේ ඕනෑම අධිකරණයක් හමුවේ වරදකරුවෙකු වූ අවස්ථාවකදී, එම අධිකරණමය තීන්දුව ලබාදුන් මොහොතේ සිට පක්ෂයේ සභාපති/ නායක ධූරය දැරීම අවසන් විය යුත්තේ ය.

(ආ) අධිකරණ තීන්දුව ලැබී දින 02ක් ඇතුළත පක්ෂ මහලේකම් විසින් පක්ෂයේ දේශපාලන මණ්ඩලය සහ පක්ෂ මධ්‍යම කාරක සභාව කැඳවිය යුතු අතර, එතෙක් තාවකාලිකව පක්ෂයේ සභාපති/ නායක ධූරයෙහි වැඩ ආවරණය කරනු ලැබිය යුත්තේ ය.

(ඇ) පක්ෂයේ දේශපාලන මණ්ඩලය සහ පක්ෂ මධ්‍යම කාරක සභාව විසින් පුරප්පාඩු වූ පක්ෂයේ සභාපති/ නායක ධූරය සඳහා පක්ෂ මහලේකම්වරයා නොවන වෙනත් ඕනෑම මධ්‍යම කාරක සභිකයෙකු පක්ෂයේ අනුප්‍රාප්තික සභාපති/පක්ෂ



* පළමුවන ව්‍යවස්ථා සංශෝධනයේදී සංශෝධනය කරන ලදී.

නායක ධුරය සඳහා රහස් ඡන්දයෙන් තෝරා පත්කර ගත යුත්තේ ය.

(ඇ) නව පක්ෂ සභාපති/ නායක තෝරා පත්කර ගත් දින සිට මාස හයක් නොඉක්මවන දිනකදී කැඳවනු ලබන විශේෂ පක්ෂ මහා සම්මේලනයකදී එම සභාව වෙත දැනුම් දී නව පක්ෂ සභාපති/පක්ෂ නායකයාගේ පත්වීම නිල වශයෙන් දැනුම් දිය යුත්තේ ය.

(vii) ඉහත (vi) සඳහන් අවස්ථාවෙදී හැර පක්ෂ සභාපති/ නායක ධුරය පුරප්පාඩු වන ඕනෑම අවස්ථාවකදී එම ධුරය සඳහා සුදුසු පුද්ගලයෙකු තෝරා පත් කර ගැනීම පක්ෂයේ දේශපාලන මණ්ඩලය සහ පක්ෂ මධ්‍යම කාරක සභාව සතු වන්නේ ය. එකී පුද්ගලයා තෝරාපත් කර ගැනීම ද ඉහත (vi) හි (ආ), (ඇ) සහ (ඇ) වගන්ති අනුව සිදු කළ යුත්තේ ය.

## * 2 පක්ෂයේ මහලේකම්වරයා

(i) මෙම තනතුර දරන්නා පක්ෂ සභාපති/පක්ෂ නායක විසින් පක්ෂ තෝරා පත්කර ගනු ලැබිය යුත්තේ ය. පක්ෂයේ මහලේකම් ධුරය සඳහා කරනු ලබන පත් කිරීම පක්ෂයේ දේශපාලන මණ්ඩලයේ 2/3 ක බහුතර ඡන්දයෙන් අනුමත කරනු ලැබිය යුත්තේ ය.

(ii) පක්ෂයේ මහලේකම්වරයා ඉල්ලා අස්වූ විටෙක, අස් කරනු ලැබූ විටෙක, මිය ගිය විටෙක හෝ පිළිගත හැකි සාධාරණ හේතුවක් මත ධුරයේ කටයුතු කළ නොහැකි බව පක්ෂ සභාපති/ නායක වෙත ලිඛිතව දැනුම් දුන් අවස්ථාවකදී, පක්ෂ සභාපති/ නායක විසින් පක්ෂයේ මධ්‍යම කාරක සභාවේ සාමාජිකයින් අතුරින් අයෙකු නව මහලේකම්වරයා ලෙස දින දෙකක් ඇතුළත පත් කර එය දේශපාලන මණ්ඩලය වෙත ඉදිරිපත් කර එහි මුළු සාමාජිකයින් සංඛ්‍යාවෙන් 2/3ක බහුතරයෙන් සම්මත කර ගත යුත්තේ ය.

(iii) සෑම පක්ෂ මහා සම්මේලනයකදීම පක්ෂයේ එතෙක් ක්‍රියාකාරීත්වය සම්බන්ධයෙන් පරිපූර්ණ වාර්තාවක් මහලේකම්වරයා විසින් සභාවට ඉදිරිපත් කළ යුත්තේ ය.

(iv) පක්ෂ මධ්‍යම කාරක සභාව සහ පක්ෂයේ දේශපාලන මණ්ඩලය අතර මනා සම්බන්ධීකරණයක් පවත්වා ගැනීමට පක්ෂ මහලේකම් සෑම විටම ක්‍රියා කළ යුත්තේ ය.

(v) වයස අවුරුදු 25ට වැඩි ඕනෑම පක්ෂ සාමාජිකයෙකුට පක්ෂයේ මහලේකම් ධුරය දැරිය හැක්කේ ය.



* පළමුවන ව්‍යවස්ථා සංශෝධනයේදී සංශෝධනය කරන ලදී.

(vi) පක්ෂයේ මහලේකම් විසින් පක්ෂයේ දේශපාලන මණ්ඩලය විසින් ගනු ලබන තීරණයන් පක්ෂ සභාපති/පක්ෂ නායකගේ අත්සනින් යුතුව පක්ෂයේ පහළ මණ්ඩලයන් වෙත යොමු කළ යුත්තේ ය.

(vii) පක්ෂයේ පහළ මණ්ඩලයන්හි ක්‍රියාකාරීත්වය පිළිබඳ ලිඛිත වාර්තා පවත්වාගැනීම පක්ෂ මහලේකම් සතු වගකීමක් වන්නේ ය.

(viii) පක්ෂ සභාපති/ නායක විසින් නිර්දේශ කරනු ලබන පක්ෂයට හිමි ජාතික ලැයිස්තු මන්ත්‍රීධුර සඳහා වූ අදාළ නම් මැතිවරණ කොමිෂන් සභාව වෙත යොමු කළ යුතු වන්නේය.

(ix) පක්ෂය සතු සියලුම නිශ්චල හා චංචල දේපළ සහ වත්කම්හි පරිපාලනය සහ නඩත්තුව සම්බන්ධයෙන් පක්ෂයේ මහලේකම් කටයුතු කළ යුතු වන අතර, ඒවායේ නෛතික භාරකරු ලෙස ක්‍රියා කළ යුත්තේ ය.

## 3 පක්ෂයේ භාණ්ඩාගාරික

(i) මෙම තනතුර දරන්නා පක්ෂ සභාපති/ නායක විසින් තෝරා පත්කරනු ලබන අතර, මොහු දේශපාලන මණ්ඩලයේ මුදල් ලේකම් ලෙස තනතුරු ද දැරිය යුත්තේ ය.

(ii) මොහු පක්ෂයේ සහ පක්ෂයට අනුබද්ධ සෑම අරමුදලක් සම්බන්ධයෙන් ගිණුම් වාර්තා පවත්වා ගත යුතු අතර, පක්ෂයේ ගිණුම් සම්බන්ධයෙන් වාර්තා පක්ෂයේ දේශපාලන මණ්ඩලයට සහ පක්ෂ මධ්‍යම කාරක සභාවට ඉදිරිපත් කිරීමට වගකීමෙන් බැඳී සිටින්නේ ය.

(iii) භාණ්ඩාගාරික විසින් පක්ෂයේ සෑම පහළ සංවිධානයකම සහ අනුබද්ධ සංවිධානයකම අරමුදල් සම්බන්ධයෙන් වූ වාර්තාවක් සෑම මාස හයකටම වරක් පක්ෂයේ දේශපාලන මණ්ඩලය වෙත ඉදිරිපත් කළ යුත්තේ ය.

(iv) පක්ෂයේ අරමුදල් ශක්තිමත් කිරීම උදෙසා වූ ක්‍රියාමාර්ග පිළිබඳ සොයා බලා පක්ෂයේ දේශපාලන මණ්ඩලය වෙත ඉදිරිපත් කිරීම පක්ෂයේ භාණ්ඩාගාරික සතු වගකීමක් වන්නේ ය.

## 4 පක්ෂයේ විනය මණ්ඩලය

(i) පක්ෂයේ විනය මණ්ඩලය පක්ෂ සාමාජිකයන්ගේ විනය සම්බන්ධ පැමිණිලි පිළිබඳ ක්‍රියා කළ යුත්තේ ය.



* පළමුවන ව්‍යවස්ථා සංශෝධනයේදී සංශෝධනය කරන ලදී.

(ii) විනය මණ්ඩලයේ සභාපතිවරයා පක්ෂ සභාපති/ නායක විසින් දේශපාලන මණ්ඩලයේ සාමාජිකයින් අතුරින් පත් කරනු ලැබිය යුත්තේ ය.

(iii) පක්ෂයේ ඕනෑම සාමාජිකයෙකු, සංවිධානයක් හෝ නිලධාරියෙකු සම්බන්ධයෙන් පක්ෂයේ සාමාජිකයෙකු හෝ සංවිධානයක් විසින් ඉදිරිපත් කරනු ලබන ලිඛිත පැමිණිලි විභාග කර පක්ෂ සභාපති/ නායක වෙත කරුණු වාර්තා කිරිමට විනය මණ්ඩලය ක්‍රියා කළ යුත්තේ ය. පක්ෂ සභාපති/පක්ෂ නායක විසින් එම පක්ෂ සාමාජිකයා/නිලධාරියා/පක්ෂ සංවිධානය සම්බන්ධයෙන් සිය අවසන් තීරණය විනය මණ්ඩලයේ නිර්දේශ මත ලබා දිය යුත්තේ ය.

(iv) විනය මණ්ඩලයේ මුළු සාමාජිකයින් සංඛ්‍යාව විනය මණ්ඩල සභාපති ද ඇතුලුව පස් දෙනෙකු ලෙස පත් කළ යුත්තේ ය.

(v) අනෙකුත් සාමාජිකයින් සියිදෙනා සඳහා සුදුසුකම් ලත් මධ්‍යම කාරක සභිකයින් අතුරින් තෝරා පත් කිරීමේ බලය ද පක්ෂ සභාපති/පක්ෂ නායක සතු වන්නේ ය.



* පළමුවන ව්‍යවස්ථා සංශෝධනයේදී සංශෝධනය කරන ලදී.

## හයවන පරිච්ඡේදය

### 1 අනුබද්ධ සංවිධාන

(i) ජාතික ප්‍රජාතන්ත්‍රවාදී පෙරමුණ යන ආරම්භක නාමයෙන් හැඳින්වෙන තරුණ/ කාන්තා/ ශිෂ්‍ය සංවිධානයන් ද ඇතුලුව දේශපාලන මණ්ඩලය විසින් අනුමත කරනු ලබන සියලුම ක්ෂේත්‍රයන් සඳහා අදාළව පිහිටවනු ලබන සංවිධාන මෙයින් අදහස් කරනු ලැබිය යුත්තේ ය.

### * 2 *ආසන සංවිධායක / මැතිවරණ කොට්ඨාශ සංවිධායක*

*(i) මැතිවරණ බල ප්‍රදේශයක් (මැතිවරණ ආසනයක්) තුළ ස්ථිර පදිංචිය දරන්නා වූ පක්ෂයේ සාමාජිකයෙකු වන පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකු සිටී නම් එම පුද්ගලයා අදාළ මැතිවරණ බල ප්‍රදේශයේ ආසන සංවිධායකවරයා ලෙස පත්වීමට සුදුසුකම් දරන අතර, අදාළ පත්කිරීම කරනු ලබන්නේ පක්ෂ සභාපති/ නායක විසිනි.*

*(ii) එම මැතිවරණ බල ප්‍රදේශයක තුළ ස්ථිර පදිංචිය දරන්නා වූ පක්ෂයේ සාමාජිකයෙකු වන පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකු නොමැති තත්ත්වයකදී එහි ස්ථිර පදිංචිය දරන්නා වූ පක්ෂයේ සාමාජිකයෙකු වන පළාත් සභා මන්ත්‍රීවරයෙකු සිටී නම් එම මැතිවරණ බල ප්‍රදේශයේ ආසන සංවිධායකවරයා ලෙස පත්වීමට සුදුසුකම් දරන අතර, අදාළ පත්කිරීම කරනු ලබන්නේ පක්ෂ සභාපති/ නායක විසිනි.*

*(iii) ඉහත සඳහන් තනතුරු දරන පක්ෂයේ සාමාජිකයෙකු යම් මැතිවරණ බල ප්‍රදේශයක් තුළ නොමැති විටෙකදී පක්ෂ සභාපති/ නායක විසින් ආසන සංවිධායකවරයෙකු පත් කරනු ලැබිය යුත්තේ ය.*

*(iv) ආසන සංවිධායකවරයා නිල බලයෙන් එම ආසන බල මණ්ඩලයේ සභාපති ධූරයට පත් වන්නේ ය.*

*(v) යම් ආසනයක් තුළ පක්ෂයේ සාමාජිකයෙකු වන වයස අවුරුදු 35ට අඩු පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකු හෝ පළාත් සභා මන්ත්‍රීවරයෙකු සිටින්නේ නම් එම පුද්ගලයා එම මැතිවරණ කොට්ඨාශයේ තරුණ සංවිධානයේ සභාපති ධූරයට ද නිල බලයෙන් පත් වනු ලබන්නේ ය. එවැනි අවස්ථාවකදී පක්ෂ සභාපති/ නායක වෙත සිය අභිමතය පරිදි ඒ පිළිබඳ තීරණ ගැනීමට බලය ඇත්තේ ය.*



* පළමුවන ව්‍යවස්ථා සංශෝධනයේදී සංශෝධනය කරන ලදී.

(vi) යම් ආසනයක් තුළ පක්ෂයේ සාමාජිකයෙකු වන පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් කිහිපදෙනෙකු ස්ථිර පදිංචිය දරනු ලබන අවස්ථාවකදී පක්ෂ සභාපති/ නායක විසින් ආසන සංවිධායකවරයා නම් කරනු ලැබිය යුත්තේ ය.

(vii) යම් ආසනයක් තුළ පක්ෂයේ සාමාජිකයෙකු වන පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් නොමැතිව එහි ස්ථිර පදිංචිය දරන්නා වූ පක්ෂයේ සාමාජිකයෙකු වන පළාත් සභා මන්ත්‍රීවරුන් කිහිප දෙනෙකු සිටී නම්, පක්ෂ සභාපති/පක්ෂ නායක විසින් ආසන සංවිධායකවරයා නම් කරනු ලැබිය යුත්තේ ය.

(viii) ආසනය තුල පක්ෂයේ සියලු කටයුතු පවත්වාගෙන යාම, ප්‍රවර්ධනය සහ ප්‍රචාරක කටයුතු මෙහෙයවීම ආසන සංවිධායකවරයා සතු වගකීම් වන්නේ ය.

(ix) ආසන සංවිධායකවරයා විසින් තමා වගකීම දරන ආසනයේ පක්ෂ ක්‍රියාකාරීත්වය පිළිබඳ විස්තර වර්තාවක් සෑම මාස තුනකට වරක් පක්ෂ මහලේකම් වෙත ලබාදිය යුත්තේ ය.

(x) ආසනය තුළ ක්‍රියාත්මක වන පක්ෂයේ අනෙකුත් සංවිධානයන් (තරුණ / කාන්තා/ ශිෂ්‍ය) සහ පක්ෂයට අනුබද්ධ අනෙකුත් සංවිධානයන්හි ක්‍රියාකාරීත්වයන සොයාබලා ඒවා පක්ෂයේ සමස්ත ක්‍රියාවලිය සමග ඒකාබද්ධව පවත්වාගෙන යාම ආසන සංවිධායකවරයා සතු වගකීම් වන්නේ ය.

(xi) යම් මැතිවරණයකදී ආසන සංවිධායකවරයා එම මැතිවරණය සඳහා අපේක්ෂකයෙකු වශයෙන් ඉදිරිපත් වීමට අවස්ථාව නොලදහොත් පක්ෂය විසින් නම් කරන ලද මැතිවරණ අපේක්ෂකයෙකු වෙත අවශ්‍ය පූර්ණ සහය ලබා දීමට ආසන සංවිධායකවරයා බැඳී සිටින්නේ ය.

(xii) ආසන සංවිධායකවරයෙකු පක්ෂයේ ප්‍රතිපත්ති, විනය උල්ලංඝනය කරනු ලැබූ විටෙකදී ඔහුගේ ක්‍රියාකාරීත්වය පොදු සමගියට, පක්ෂයේ දේශපාලන මතවාදී එක්සත්භාවයට සහ පක්ෂයේ කීර්තියට හානිකර යැයි ඒත්තු යන විටෙකදී එම ආසන සංවිධායකවරයා තනතුරින් ඉවත් කිරීමට පක්ෂ සභාපති/පක්ෂ නායක වෙත බලය ඇත්තේ ය.



* පළමුවන ව්‍යවස්ථා සංශෝධනයේදී සංශෝධනය කරන ලදී.

ජාතික ප්‍රජාතන්ත්‍රවාදී පෙරමුණ
NATIONAL DEMOCRATIC FRONT

57

## හත්වන පරිච්ඡේදය

### 1 පක්ෂ මහා සම්මේලනය - කැඳවීම / මූලාසනය / කාලය

* *(i) පක්ෂ මහා සම්මේලනය අවම වශයෙන් වසර 05කට වරක් හෝ කැඳවිය යුත්තේ ය.*

(ii) පක්ෂ සම්මේලනය පවත්වනු ලබන දිනය පක්ෂයේ දේශපාලන මණ්ඩලය විසින් තීරණය කරනු ලැබිය යුත්තේ ය.

(iii) විශේෂ පක්ෂ මහා සම්මේලන කැඳවීම සඳහා දේශපාලන මණ්ඩලයට පූර්ණ බලය ඇත්තේ ය.

(iv) පක්ෂ සභාපති/නායක විසින් පක්ෂ මහා සම්මේලනයේ මූලසුන දැරිය යුත්තේ ය.

(v) පක්ෂයේ සභාපති ධූරය හිස් වූ අවස්ථාවක කැඳවනු ලබන පක්ෂ මහා සම්මේලනයකදී පක්ෂයේ නව සභාපතිවරයෙකු තෝරා පත්කර ගන්නා තෙක් සම්මේලනයේ වැඩකටයුතු පක්ෂයේ මහලේකම් විසින් මෙහෙය විය යුත්තේය.

(vi) පක්ෂ මහා සම්මේලනය පක්ෂ සභාපති/නායකගේ නියෝගය අනුව මහලේකම්වරයා විසින් කැඳවිය යුත්තේ ය.

### * *2 පක්ෂ මහා සම්මේලනය සඳහා සහභාගී වීමට සුදුසුකම් ලත් පක්ෂ නියෝජිතයින්*

*(i) පක්ෂයේ දේශපාලන මණ්ඩලයේ සියලුම සාමාජිකයින්*

*(ii) පක්ෂ මධ්‍යම කාරක සභාවේ සියලුම සාමාජිකයින්*

*(iii) පක්ෂයේ සාමාජිකයින් වන සියලුම පාර්ලිමේන්තු / පළාත් සභා / පළාත් පාලන ආයතනවල සියලුම ගරු මන්ත්‍රීවරුන්*

*(iv) දිස්ත්‍රික් බලමණ්ඩලයන්හි සභාපති, ලේකම් සහ භාණ්ඩාගාරික නිලයන් දරනන් ඇතුළු ක්‍රියාකාරී සාමාජිකයින් පස්දෙනෙකු බැගින්*

*(v) ආසන බලමණ්ඩලයන්හි සභාපති, ලේකම් සහ භාණ්ඩාගාරික නිලයන් දරනන් ඇතුළු ක්‍රියාකාරී සාමාජිකයින් පස්දෙනෙකු බැගින්*



* පළමුවන ව්‍යවස්ථා සංශෝධනයේදී සංශෝධනය කරන ලදී.

*(vi)* *ප්‍රාදේශීය බලමණ්ඩලයන්හි සභාපති, ලේකම් සහ භාණ්ඩාගාරික නිලයන් දරනන් ඇතුළු ක්‍රියාකාරී සාමාජිකයින් පස්දෙනෙකු බැගින්*

*(vii)* *දිස්ත්‍රික් තරුණ සංවිධානයන්හි සභාපති, ලේකම් සහ භාණ්ඩාගාරික නිලයන් දරනන් ඇතුළු ක්‍රියාකාරී සාමාජිකයින් පස්දෙනෙකු බැගින්*

*(viii)* *දිස්ත්‍රික් කාන්තා සංවිධානයන්හි සභාපති, ලේකම් සහ භාණ්ඩාගාරික නිලයන් දරනන් ඇතුළු ක්‍රියාකාරී සාමාජිකයින් පස්දෙනෙකු බැගින්*

*(ix)* *පක්ෂයේ සෑම අනුබද්ධ සංවිධානයන්හි සභාපති, ලේකම් සහ භාණ්ඩාගාරික නිලයන් දරනන්න ඇතුළු ක්‍රියාකාරී සාමාජිකයින් පස්දෙනෙකු බැගින්*

*(x)* *තරුණ පෙරමුණු මධ්‍යම කාරක සභාවේ සියලුම සාමාජිකයින් සහ කාන්තා පෙරමුණු මධ්‍යම කාරක සභාවේ සියලුම සාමාජිකයින්*

*(xi)* *සියළුම ආසන සංවිධායකවරුන් සහ දිස්ත්‍රික් සංවිධායකවරුන්, දිස්ත්‍රික් කළමනාකරුවන් හා දිස්ත්‍රික් සම්බන්ධීකාරකවරුන්*

## 3 පක්ෂ මහා සම්මේලනයක කාර්යභාරය

(i) මෙය පක්ෂයේ සියලුම අංශයන්හි නියෝජිතයින් ඒකරාශී වන්නා වූ එකම සම්මේලනය වන බැවින් පක්ෂයේ වර්ධනය, ගමන් මාර්ගය, පක්ෂ සංවිධානය සහ සාමාජිකයින් සම්බන්ධයෙන් පුළුල් ලෙස සාකච්ඡාවට භාජනය කරන්නාවූත්, පක්ෂයේ සියලුම අංශයන් තුළ මතවාදී එක්සත් භාවයක් ඇතිකිරීම සඳහා ප්‍රධානතම වේදිකාව වශයෙන් ක්‍රියාත්මක විය යුත්තේ ය.

(ii) පක්ෂයේ සභාපති/ නායක අවශ්‍ය අවස්ථාවන්හි පත් කර ගැනීමට පක්ෂ මහා සම්මේලනයේ නියෝජිතයින්ට හැකියාව ඇත.

(iii) පක්ෂයේ වර්ධනය සඳහා අවශ්‍ය යැයි හැඟෙන තීරණ සම්මත කර ගැනීමට, පක්ෂ ව්‍යවස්ථාව සංශෝධනය කිරීමට පක්ෂ මහා සම්මේලනයේ නියෝජිතයින්ට හැකියාව ඇත්තේ ය.

(iv) පක්ෂයේ දේශපාලන මණ්ඩලය විසින් ගනු ලැබ ඇති තීරණයන් සම්බන්ධයෙන් පක්ෂ මහා සම්මේලනයට කරුණු පැහැදිලි කිරීමට, විග්‍රහ කිරීමට පක්ෂයේ සභාපති/නායක කටයුතු කළ යුත්තේ ය. එම තීරණ සම්බන්ධයෙන් පක්ෂ මහා සම්මේලනයේ දී විවෘතව තම අදහස් ප්‍රකාශ කිරීමට සියලුම නියෝජිතයින්ට අයිතිය ඇත්තේ ය. නියෝජිතයින් විසින් ඉදිරිපත් කරනු ලබන සියලුම අදහස් සම්බන්ධයෙන් පක්ෂයේ දේශපාලන මණ්ඩලය සැලකිලිමත් වීමට බැඳී සිටින්නේ ය.



* පළමුවන ව්‍යවස්ථා සංශෝධනයේදී සංශෝධනය කරන ලදී.

57

*ඉදිරිපත් කරනු ලබන සියලුම අදහස් සම්බන්ධයෙන් පක්ෂයේ දේශපාලන මණ්ඩලය සැලකිලිමත් විමට බැඳී සිටින්නේ ය.*



* පළමුවන ව්‍යවස්ථා සංශෝධනයේදී සංශෝධනය කරන ලදී.

1995 මාර්තු 10 වන දින සම්පාදනය කර 2022 ඔක්තෝබර් මස 30 වන දින පළමු වරට සංශෝධිතයි.

## අටවන පරිච්ඡේදය

### * 1 විශේෂ විධිවිධාන

1. ජාතික ප්‍රජාතන්ත්‍රවාදී පෙරමුණ නියෝජනය කරමින් පාර්ලිමේන්තු, පළාත් පාලන හෝ පළාත් සභා මැතිවරණයකදී තේරී පත්වන මහජන නියෝජිතයින් විසින්,

   (i) මන්ත්‍රී ධූරයට හිමි වැටුප ලබා නොගත යුත්තේ ය.

   (ii) ඉන්ධන දීමනාව, දුරකථන දීමනාව, කාර්යාල දීමනාව, මුද්දර දීමනාව ඇතුළු සියලුම දීමනා ප්‍රතික්ෂේප කළ යුත්තේ ය.

   (iii) රජයේ නිල නිවාස සහ බංගලා ප්‍රතික්ෂේප කළ යුත්තේ ය.

   (iv) මන්ත්‍රීවරුන් සඳහා ලැබෙන තීරු බදු රහිත වාහන බලපත්‍රය ලබා නොගත යුත්තේ ය.

   (v) ආරක්ෂාව වෙනුවෙන් ප්‍රභූ ආරක්ෂක නිලධාරීන්ගේ සහය ලබා නොගත යුත්තේය. එසේ ආරක්ෂාව ලබාගැනීම අත්‍යාවශ්‍ය නම්, ඒ සඳහා අදාළ මුදල රජයට ගෙවිය යුත්තේ ය.

   (vi) පාර්ලිමේන්තුවේ ආපන ශාලාවෙන් මහජන මුදලින් ආහාර පාන නොගත යුත්තේ ය.

   (vii) රජයේ වාහන භාවිතා නොකළ යුත්තේ ය.

   (viii) වත්කම් බැරකම් ප්‍රකාශ ප්‍රසිද්ධියට පත්කළ යුත්තේ ය.

   (ix) මහජන මුදල් වැය කරමින් සිදුකරන විදේශ සංචාර ප්‍රතික්ෂේප කළ යුත්තේ ය.



* පළමුවන ව්‍යවස්ථා සංශෝධනයේදී සංශෝධනය කරන ලදී.

57

2. ඕනෑම පාර්ලිමේන්තු, පළාත් පාලන හෝ පළාත් සභා මැතිවරණයකදී,

(i) නාමයෝජනා භාරදෙනු ලබන අපේක්ෂකයින් අතුරින් 80%ක ප්‍රතිශතයක් තරුණ ප්‍රජාව (වයස අවුරුදු 18 – 45ත් අතර) නියෝජනය වන පරිදි සකස් කිරීමට පක්ෂයේ නාමයෝජනා මණ්ඩලය ක්‍රියා කළ යුත්තේ ය.

(ii) එසේ කිරීමෙන් අපේක්ෂා කරනුයේ, පක්ෂයේ මහජන නියෝජිතයින් මෙන්ම පක්ෂය ජනරජයේ රාජ්‍ය බලය ලබා ගැනීමේදී එම ජනතා නියෝජිත බලය සෑම විටම තරුණ පරපුර වෙතට උරුම කර දීම යන පක්ෂයේ උත්තරීතර අරමුණ සාක්ෂාත් කර ගැනීම වන්නේ ය.

(iii) නාමයෝජනා සඳහා අපේක්ෂයින් තෝරීමේදී සෑමවිටම උගත්, පිළිගත් වෘත්තියවේදී හෝ ව්‍යවසායක තරුණ අපේක්ෂකයින් සඳහා වැඩි ඉඩක් ලබා දීමට කටයුතු කළ යුත්තේ ය.

(iv) මෙම අපේක්ෂකයින් අතර කාන්තා නියෝජනය 30%ක මට්ටමක පවත්වා ගැනීමට පක්ෂ නාමයෝජනා මණ්ඩලය විසින් සෑමවිටම ක්‍රියා කළ යුත්තේ ය.

(v) ජනාධිපතිවරණයකදී පක්ෂය විසින් ඉදිරිපත් කරනු ලබන අපේක්ෂකයා තෝරා ගැනීම සඳහා පක්ෂයට අනුබද්ධ සියලුම බල මණ්ඩලයන්හි යෝජනා සැලකිල්ලට ගත යුතු අතර, අවශ්‍ය වේ නම් පක්ෂයේ විශේෂ මහා සම්මේලනයක් කැඳවා අවසන් තීන්දුවකට පැමිණිය යුත්තේ ය.

(vi) කිසිදු මැතිවරණයක් සඳහා කිසිදු ආගමික සංස්ථාවක් නියෝජනය කරනු ලබන පූජක උතුමන්වහන්සේලා වෙත පක්ෂයේ නාමයෝජනා මණ්ඩලය විසින් නාමයෝජනා ලබා නොදිය යුත්තේ ය.

3. ජාතික විශේෂඥ උපදේශක සභාව

(i) පක්ෂයේ දේශපාලන මණ්ඩලය සහ පක්ෂයේ මධ්‍යම කාරක සභාව ඇතුළු පක්ෂයට අනුබද්ධ සියලුම බල මණ්ඩලයන් සඳහා රටේ සමස්ත රාජ්‍ය පාලන අංශයන් අයත් සියලු පද්ධති ආවරණය වන පරිදි අවශ්‍ය උපදෙස්, මගපෙන්වීම, ප්‍රතිපත්ති සහ සැලසුම් හඳුන්වාදීම



* පළමුවන ව්‍යවස්ථා සංශෝධනයේදී සංශෝධනය කරන ලදී.

වෙනුවෙන් වන ජාතික විශේෂඥ උපදේශක සභාවක් පවතින්නේ ය.

(ii) ජාතික විශේෂඥ උපදේශක සභාවේ අවම සාමාජික සංඛ්‍යාව විසිපහක් (25) වන්නේ ය.

(iii) ජාතික විශේෂඥ උපදේශක සභාව සඳහා සාමාජිකයින් පත් කිරීම සඳහා පක්ෂ මධ්‍යම කාරක සභාවේ අනුමැතියට යටත්ව පක්ෂ සභාපති/නායක සහ මහලේකම් වෙත බලය ඇත්තේ ය.

(iv) ජාතික විශේෂඥ උපදේශක සභාවේ සාමාජිකයින් රාජ්‍ය පාලන පද්ධතියේ සියලුම අංශ නියෝජනය වන පරිදි පිළිගත් උගතුන්, විශේෂඥයින්, ආචාර්ය මහාචාර්යවරුන් සහ ඉහළම මට්ටමේ පරිපාලන නිලධාරීන්ගෙන් සමන්විත විය යුත්තේ ය.

(v) කිසිදු ජාතිවාදී හෝ ආගම්වාදී දේශපාලන මතයක් දරනු ලබන, ප්‍රවර්ධනය හෝ අනුබල දෙන්නෙකු ජාතික විශේෂඥ උපදේශක සභාවේ නොසිටිය යුත්තේ ය.

(vi) පක්ෂය විසින් ක්‍රියාවට නැංවිය යුතු රාජ්‍ය පාලන සැලසුම් ප්‍රතිපත්ති සහ මූලධර්මයන් මෙන්ම පක්ෂයේ දර්ශනය සම්පාදනය කර ශ්‍රී ලාංකික රාජ්‍යයේ අනාගත සමෘද්ධිය සහ සමගිය සහ අභිමානය යළි ගොඩනැංවීම සඳහා වන පක්ෂයේ උතුම් අරමුණ සාක්ෂාත් කර ගැනීම සඳහා දාර්ශනික මගපෙන්වීම ලබාදීම මෙම සභාවේ කාර්යභාරය වේ.

4. පක්ෂ සංවිධානය ක්‍රියාත්මක වීමේදී ඇතිවන ගැටලුකාරී තත්ත්වයන් පවතින්නේ නම්,

(i) මෙම ව්‍යවස්ථාව තුළ අවශ්‍ය විධිවිධානයන් අන්තර්ගත නොවන්නේ නම් එම තත්ත්වයන් පක්ෂ සභාපති/නායක වෙත ලිඛිතව දැනුම්දිය යුත්තේ ය.

(ii) එම දැන්වීම කිරීමේ බලය අදාළ සංවිධානයේ ලේකම්වරයා සතු වන්නේ ය.

(iii) එම ලිඛිත දැන්වීම ලැබී සති දෙකක (02) කාලයක් ඇතුළතදී පක්ෂයේ සභාපතිවරයා ඇතුළු දේශපාලන



* පළමුවන ව්‍යවස්ථා සංශෝධනයේදී සංශෝධනය කරන ලදී.

මණ්ඩලය විසින් අවශ්‍ය නව විධිවිධානයන් සකස් කිරීමට කටයුතු කළ යුත්තේ ය.

(iv) එසේ පක්ෂයේ දේශපාලන මණ්ඩලය විසින් නිගමනය කරන්නා වූ නව ව්‍යවස්ථා අංගයන් සම්බන්ධයෙන් පක්ෂයේ මධ්‍යම කාරක සභාව වෙත ඉදිරිපත් කර අනුමත කරවා ගැනීමෙන් අනතුරුව, පක්ෂයට අනුබද්ධ සියලුම සංවිධාන වෙත වහාම නිකුත් කිරීමට පක්ෂයේ මහලේකම් විසින් ක්‍රියා කළ යුත්තේ ය.

(v) මේ පිළිබඳ ගනු ලබන සෑම ක්‍රියාමාර්ගයක් පිළිබඳව මධ්‍යම කාරක සභාව වෙත පූර්ණ පැහැදිලි කිරීමක් සිදු කිරීමට පක්ෂ මහලේකම්වරයා බැඳී සිටින්නේ ය.

(vi) ඉනික්බිතිව එළැඹෙන පක්ෂ මහා සම්මේලනයකදී පනවා ඇති නව විධිවිධානයන් පිළිබඳ පැහැදිලි කිරීමක් ඉදිරිපත් කර, ඒ සඳහා පක්ෂ මහා සම්මේලනයේ අනුමැතිය ලබා ගැනීමට පක්ෂ සභාපති/පක්ෂ නායක බැඳී සිටින්නේ ය.

5. මෙම ව්‍යවස්ථාවේ සඳහන් යම් විධිවිධානයක් හෝ විධිවිධානයන් භාවිතයේදී මෙම ව්‍යවස්ථාවේම සඳහන් තවත් විධිවිධානයක් සමඟ යම් අනනුකූලතාවයක් නිරීක්ෂණය වූ තන්හි ඒ පිළිබඳ අවසන් විග්‍රහය ඉදිරිපත් කිරීමේ පූර්ණ බලය පක්ෂයේ දේශපාලන මණ්ඩලය සතුව පවතින්නේ ය.

6. මෙම ව්‍යවස්ථාවේ සඳහන් යම් වගන්තියක් සම්බන්ධයෙන් අර්ථ නිරූපණයේදී යම් අපහසුතාවයක් පවතින්නේ නම් එය විග්‍රහ කිරීමේ පූර්ණ බලය පක්ෂයේ දේශපාලන මණ්ඩලය සතු වන්නේ ය.

7. ජාතික ප්‍රජාතන්ත්‍රවාදී පෙරමුණ පිළිගත් දේශපාලන පක්ෂයක් වශයෙන් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මැතිවරණ කොමිෂන් සභාව විසින් ලියාපදිංචි කර ඇති බැවින්, පක්ෂය වෙනුවෙන් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මැතිවරණ කොමිෂන් සභාව සමඟ රාජකාරීමය කටයුතු සිදුකිරීමේ පූර්ණ බලය පක්ෂ සභාපති/ නායක වෙනුවෙන් පක්ෂයේ මහලේකම් විසින් දරනු ලබන්නේ ය.

8. මෙම ව්‍යවස්ථාවේ සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි භාෂා පාඨ අතර අනනුකූලතාවයක් ඇති වුවහොත්, එවිට සිංහල භාෂා පාඨය බල පැවැත්විය යුත්තේ ය.

***



* පළමුවන ව්‍යවස්ථා සංශෝධනයේදී සංශෝධනය කරන ලදී.

57

K 1

ඇමුණුම - 06

<u>පක්ෂයේ මහා සම්මේලනය විසින් යාවත්කාලීන කරන ලද මැතිවරණ සලකුණ</u>

